FACULTY OF GRADUATE STUDIES, 2013

Mallawarachchi, Asitha
PAPER

# අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් face book යොදා ගැනීමේ ශක්‍යතාවය
## (පාසල් අධ්‍යාපනය සඳහා face book භාවිතා කිරීම පිළිබඳව කරනු ලබන පර්යේෂණාත්මක අධ්‍යයනය)

Mallawarachchi, Asitha, Department of Mass Communication, University of Kelaniya

කාලය අවකාශය හරහා විනිවිද යෑමේ තාක්ෂණික ශක්තිය රැගත් නව  මාධ්‍ය අප සතුය. ඉන් ගොඩනැගෙන්නා වූ  අනාගතය වඩාත් අභියෝගයක් වන්නේ අපගේ අනාගත පරපුරටය. තොරතුරු ගහණ ලෝකයේ මනා සංජානනයෙන් යුක්ත පරපුරක් බිහි කිරීමේ අභියෝගයට  කදිම පිළිතුරක් ලෙස නව මාධ්‍ය දැක්විය හැකිය. අනෙක් අතට අපගේ වර්තමාන පරපුර හුදෙක් පරිශීලනය කරනු ලබන්නේ නව මාධ්‍යය බව තර්කයකින් තොර ව පිළිගත හැකිය. එහිදී මුහුණු පොත (face book) යන සමාජ වෙබ් අඩවියට  හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. අනෙක් අතට වර්තමාන ළමා පරපුර තුළ ප්‍රබල ලෙස නැඹුරුවක් මේ තුළට යොමු වී ඇත. එවැනි සමාජ වෙබ් අඩවියක් අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් යොදා ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කරනු ලැබේ.

මෙහිදී පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගනු ලබන්නේ සමාජ වෙබ් අඩවි තුළ එන මුහුණු පොත **(face book)** අධ්‍යපන මාධ්‍යයක් වශයෙන් යොදා ගැනීම ඵලදායකද ? යන්නයි. ඊට ගොඩනගා ගත් උපන්‍යාසය වන්නේ, අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් මුහුණු පොත **(face book)**යොදා ගැනීම ඉතා ඵලදායකයි යන්නයි. මෙම පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත රැස් කිරීමට පොත්පත් පරිශීලනය, පුවත්පත් සඟරා හා අන්තර්ජාල ලිපි පරිශීලනය කරනු ලැබේ. ඊට අමතරව ද්විතීයික දත්ත ලබා ගැනීමට අදාළ අධ්‍යයන සීමාව තුළ තෝරා ගන්නා පාසල් සිසුන්ගේ මුහුණු පොත (face book)භාවිතය පිළිබඳ සංඛ්‍යාත. ඔවුන්ගේ යහළුවන් ප්‍රමාණය, හුවමාරු කරගන්නා තොරතුරු මොනාවාද? යන්න පිළිබඳව ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව තොරතුරු රැස් කරනු ලැබේ. එමෙන්ම නිර්මාණය කරන ලද face book ගිණුමක් මගින් ඔවුන් හා සම්බන්ධ වී පාසල් විෂයය මාලාවට අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම සිදු කරනු ලැබේ. මේ සදහා අධ්‍යයන සීමාව ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාන්ත ආනා පිරිමි විද්‍යාලය, මලියදේව පිරිමි විද්‍යාලය, මලියදේව බාලිකා විද්‍යාලය, ශ්‍රීමත් ජෝන් කොතලාවල මධ්‍ය මහා විද්‍යාලය, ශුද්ධ වූ පවුලේ බාලිකා විද්‍යාලය හා මලියදේව ආදර්ශ මහා විද්‍යාලය යන පාසල්වල මුහුණු පොත (face book) ගිණුම් ඇති සිසුන්ගෙන් 100ක් තෝරා ගනු ලැබේ. එලෙස රැස්කරගත් දත්ත අනුතර්ගත විශ්ලේෂණයට ලක් කර උපන්‍යාසය සත්‍යක්ෂණය කරනු ලැබේ.

ඒ ඔස්සේ ලැබෙන නිගමන ලෙස මුහුණු පොත (face book) භාවිතා කරන්නේ හුදෙක් විනෝදය හා කාලය ගත කිරීමට ද , විහිළු තහළු. කාලීන තොරතුරු, දර්ශන, ගීත, video වැනි දෑ හුවමාරු කර ගැනීමට ද වැඩිපුර කැමැත්තක් දක්වන අතර අධ්‍යාපන පාඩම්වලට අදාළව තොරතුරු හුවමාරුව අවම මට්ටමක ඇති බවත් අධ්‍යාපන මාධ්‍යයකට වඩා ඔවුන් මුහුණු පොත (face book) විනෝදය සඳහා යොදා ගනු ලබන්නේ ද යන කරුණු වලට අවධානය යොමු වේ

ප්‍රමුඛ පදඃ මුහුණු පොත, අධ්‍යාපන, මාධ්‍යය